විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය

ඇබෑර්තු

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT) යනු දැනට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. පර්යේෂණ හා සංවර්ධනය, පුහුණුව සහ තාක්ෂණ හුවමාරුව තුළින් ඉලෙක්ට්‍රොනික විද්‍යුව, සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය, රොබෝ තාක්ෂණය සහ අභ්‍යවකාශ තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි නූතන තාක්ෂණයන් රට තුළට හඳුන්වාදීම වේගවත් කිරීම මෙම ආයතනය වෙත පැවරී ඇති වගකීම වේ.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි සේවය කරන සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් පහත සඳහන් තනතුර සඳහා මෙම ආයතනය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (MM 1-1)

එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම මත

සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් සියලුම ප්‍රතිලාභ පිළිබඳ විස්තර සඳහා කරුණාකර නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න: www.accimt.ac.lk

අවසාන දිනය: 2026/11/30

ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් මෙන්ම අදාළ සහතික පත්‍රවල පිටපත් සහිත අයදුම්පත්, අවසාන දිනයට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන සේ එවිය යුතුය. කරුණාකර දැන්වීමට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය භාවිතා කරන්න. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්පතේ පූර්ව පිටපතක් ඍජුවම එවිය හැක. අයදුම් කරන තනතුර කවරයේ ඉහළ වම්පස කෙළවරේ සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන: ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී,
නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය,
කටුබැද්ද, මොරටුව.

දුරකථන : +94(0)11-2650838, +94(0)11-2650569

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED